# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/52/2026 (NPC)

දාපන දූරගේ දිනේෂ් වීරසිංහ
**අභියාචක**

**එදිරිව**

ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.06.23**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුනතිලක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්‍ෂ මාලා බස්නායක මහත්මිය.

## -<u>නියෝගය</u>-

දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන් දුනිමි. අභියාචක විසින් 2026.02.26 දින ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඔහු වෙත ඉදිරිපත් කර ඇති චෝදනාවන්ට ඔහුව වැරදිකරු කිරීමෙන් අනතුරුව පනවන ලද විනය දඩුවම ඉවත් කර, ඒ සඳහා ලිහිල් දඩුවමක් පනවන ලෙසයි. අභියාචක වෙත 2019.11.14 වෙනි දිනැතිව බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් නිකුත් කර ඇති ලේඛනය මඟින් අභියාචකට එරෙහිව චෝදනා 04ක් ඉදිරිපත් කර ඇත. එකී චෝදනා පදනම් කරගෙන ඇත්තේ, අභියාචක 2019.07.08 දින සිවිල් ඇඳුමින් සැරසී, අත් විලංගු කුට්ටමක් සමඟ VH – 9204 දරණ යතුරු පැදියෙන් ගොස්, පොලිස් නිලධාරියෙකු ලෙස පෙනී සිටිමින්, නයිජීරියානු ජාතික කෙනඩි ඉමෙරිහා උසේබු යන තැනැත්තා පැහැර ගෙන ගොස් එම අය සතුව තිබූ රුපියල් ලක්‍ෂ විසිතුනක (රු.2,300,000/=) මුදලක් කොල්ලකෑවා යැයි කියනු ලබන සිද්ධියකි. සියලුම චෝදනාවන් ඉදිරිපත් කර ඇත්තේ එම සිද්ධිය පදනම් කරගෙනය. මේ සම්බන්ධයෙන් පවත්වන ලද විධිමත් විනය පරීක්‍ෂණයේදී ඉහත කී නයිජීරියානු ජාතික කෙනඩි ඉමෙරිහා උසේබු යන තැනැත්තා සාක්ෂි ලබා දී නැති නමුත්, මහේස්ත්‍රාත් අධිකරණයේ පවත්වන ලද හඳුනා ගැනීමේ පොරෙට්ටුවේ දී, ඉහතින් නම් සඳහන් කළ කෙනඩි ඉමෙරිහා උසේබු යන අය

විසින්, මෙම අභියාචක මෙම සිද්ධියට සම්බන්ධ බවට හඳුනා ගෙන ඇත. එම කරුණ විවාදයට ලක්වන්නේ නැත.

ඊට අමතරව අභියාචක රාජකාරී ස්ථානයෙන් බැහැරව යාම සඳහා කිසිදු සටහනක් යොදා නොමැතිව, නිල ඇඳුමින් සැරසී මෙම සිද්ධියට සහභාගී වී ඇති බවටද පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වී ඇත. මෙහිදී වඩාත් වැදගත් කරුණ වන්නේ, රුපියල් තුන් ලක්ෂ හතලිස් අටදහසක (රු.348,000/=) මුදලක් අභියාචක නිදන ඇඳේ මෙට්ටය යට තිබී සොයා ගෙන තිබීමයි. මේ සම්බන්ධ අභියාචකගෙන් විමසන ලදුව, ඔහු ප්‍රකාශ කර සිටියේ රු.12,000/=ක් බැගින් වූ වාරික 12කින් යුක්ත වූ සීට්ටුවකින් එම මුදල් ලැබුණ බවයි. එම කරුණ සත්‍ය නම්, ඔහු ලඟ තිබිය යුත්තේ රු.144,000/=ක මුදලක් පමණි. ඊට අමතරව වූ රුපියල් ලක්ෂ දෙකක් හෝ ඊට වැඩි මුදලක් ඔහු වෙත කුමනාකාරයකින් ලැබුණාද යන්න සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි කිරීමක් අභියාචක විසින් ඉදිරිපත් නොකරයි. තවද අත් විලංගු කුට්ටමක් කිසිදු අවසරයකින් තොරව රැගෙන යාමටද අභියාචක හේතුවක් ඉදිරිපත් නොකරයි.

ඉහත කරුණු සළකා බැලීමෙන් අනතුරුව විනිශ්චය අධිකාරයේ මතය වන්නේ අභියාචක වෙත පනවා ඇති දඬුවම සම්බන්ධයෙන් මැදිහත් නොවිය යුතු බවයි.

ඉහත කරුණු සළකා බලා, අභියාචක ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-